සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

නම : ..............................................    නර්තනය    කාලය : පැය 02 යි.

වැදගත් :

- සියලු ම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.

---

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) උඩරට පා සරඹ වල ''තා තෙයි තා තෙයියත් තා'' යන පදය අයත් සරඹ නාමය වන්නේ,

1. දැල අඩිය    2. පසු පෙර අඩිය
3. නුහුරු අඩිය    4. සිව් අඩිය

(2) උඩරට ගොඩ සරඹ වල එන දැල සරඹය යනු,

1. හයවන ගොඩ සරඹයයි.    2. තුන්වන ගොඩ සරඹයයි.
3. පස්වන ගොඩ සරඹයයි.    4. හතරවන ගොඩ සරඹයයි.

(3) ''ඔබින මෙසබ තුල පැමිණා'' මෙම කවි පදය අයත් වන්නම වනුයේ,

1. තුරංගා වන්නම    2. හනුමා වන්නම
3. වෛරොඩි වන්නම    4. මයුරා වන්නම

(4) කහ ඉර හරහා පාර මාරුවීමේ දී හදිසියෙන් වාහනයක් තිරිංග තද කිරීම මගින් ඇතිවන ස්ථායිභාවය නම්,

1. උත්සාහ    2. භය
3. සතුට    4. ශෝකය

(5) ''මල් ගවසාලා කොණ්ඩය බැඳලා'' යන සවරං කවියේ තාල රූපය වන්නේ,

1. මාත්‍රා 3 + 4    2. මාත්‍රා 3 + 3
3. මාත්‍රා 4 + 4    4. මාත්‍රා 2 + 3

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.
(පතුරු, පහතරට, නමස්කාර, අලංකාර පද, පා සරඹ)

(6) ............................................ නැටුම ශරීරයට තැලීමේ චලන සහිත ගැමි නැටුමකි.

(7) හිස, කඳ, අත්, පා, බෙල්ල, දෑස යන ශාරීරික අංග හැඩගස්වා ගැනීමට.............................................. අභ්‍යාස ඉතා වැදගත් වේ.

(8) නර්තන අංගයක විචිත්‍රත්වය සඳහා .................................................................... භාවිත කරයි.

(9) සතර බීජාක්ෂරවල 'දිත්' අක්ෂරය ............................................... බෙරයෙන් වාදනය කරයි.

(10) සරඹ 12 සඳහා එක් හමාර පදයක් පමණක් භාවිත කරනු ලබන්නේ ....................................................... වලදීය.

● **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු දී ඇති ප්‍රහේලිකාව ඇසුරින් ලියන්න.**

| | (13) | | (14) | | (15) |
|---|---|---|---|---|---|
| (11) | ප | | | | ත |
| | | | | | |
| (12) | ති | | | | |
| | | | | | ඩ |

හරහට

(11) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණ නර්තන ශිල්පියෙකි.

(12) තාලය හඳුන්වන තවත් නමකි.

පහළට

(13) දළඳා මාළිගාවේ සතර දේවාලවලින් එකකි.

(14) මුහුණින් ප්‍රකාශ කරන හැඟීම් මේ නමින් හැඳින්වේ.

(15) සතර බීජාක්ෂර වල ''තත්'' අක්ෂරයෙන් නිර්මාණය කරගන්නා පද කොටසකි.

● **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නොගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) පතුරු, සවරං, සිරසපාද, ලී කෙළි

(17) ගල් කැටයම්, සිතුවම්, සංදේශ, ලී කැටයම්

(18) විජය රජු, සේරිමාන් රජු, පඬුවස්දෙව් රජු, පණ්ඩුකාභය රජු

(19) ලය, දිසා, අවකාශය, තල

(20) බුලත්, කොතල, පැහිදුම් පෙට්ටිය, පොල්

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තෝරාගත් තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

- පහත රූප සටහන ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.



(1) (අ) ඉහත රූප සටහනේ දැක්වෙන බෙරය අයත් නර්තන සම්ප්‍රදාය නම් කර එම බෙරය භාවිත මඩු ශාන්ති කර්මයක් නම් කරන්න.

1. .......................................................................... 2. ..........................................................................

(ආ) ශාන්තිකර්ම හා බැඳි පොදු චාරිත්‍ර දෙකක් නම් කරන්න.

1. .......................................................................... 2. ..........................................................................

(ඇ) උඩරට නර්තන සම්ප්‍රදායට හා පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ඇඳුම් කට්ටල 2 නම් කරන්න.

1. .......................................................................... 2. ..........................................................................

(ඈ) ඉහත රූප සටහන භාවිතා කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| රූපයේ දැක්වෙන බෙරය හඳුන්වන නම් දෙකක් ලියන්න. | බෙරය වාදනය කරන අවස්ථා දෙකක් නම් කරන්න. |
|---|---|
| 1. .......................................... | 1. .......................................... |
| 2. .......................................... | 2. .......................................... |

(02) නර්තන, ගායන, වාදන යන ප්‍රායෝගික ක්‍රියාවලිය ලිඛිතව දැක්වීමේ ක්‍රමවේදය ප්‍රස්තාරකරණයයි.

(1) **දොං දොං ජිං ජිං ගජිගත** බෙර පදය නියමිත තිත් රූපයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 02)

(2) මාත්‍රා 4 + 4 තාල රූපයට අදාල ඔබ ඉගෙන ගත් ජන ගායනයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(3) වෛරොඩි වන්නමේ කස්තිරම නියමිත තිත් රූපයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(03) දක්ෂිණ භාරතයේ පැරණිතම ශාස්ත්‍රීය නෘත්‍යය භරත නාට්‍යම් වේ.

(1) භරත නාට්‍යම්හි නට්ටුවනාර්වරු දෙදෙනෙක් නම් කර එක් අයෙකු පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(2) අරංග්‍රේත්‍රම් සංදර්ශනයක අනුපිළිවෙල ලියන්න. (ලකුණු 03)

(3) භරත නාට්‍යම් සම්ප්‍රදායෙහි භාවිත ඇඳුම් කට්ටලයේ කොටස් හතරක් නම් කර ඒවා පළඳින ස්ථාන සඳහන් කරන්න. (ලකුණු 04)

(04) ශ්‍රී දළදා පෙරහැර ලාංකේය දේශයේ ප්‍රෞඪත්වය හා අභිමානය විදහා දක්වන ජාතික උත්සවයකි.

(1) දළදා පෙරහැර පැවැත්වීමේ අරමුණු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) එම පෙරහැර අලංකාර කරන නර්තන අංග හතරක් නම් කර ඒවා විස්තර කරන්න. (ලකුණු 04)

(3) දළදා පෙරහැරෙහි සංස්කෘතික වටිනාකම අගය කරමින් පුවත් පතකට සුදුසු ලිපියක් සකස් කරන්න.

(ලකුණු 04)

(05) ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ කලාකරුවන් සැමදා අගය කරමු.

ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් ශිල්පියෙකු පිළිබඳ පහත සඳහන් සිරස්තල යටතේ කරුණු දක්වන්න.

- ජීවන තොරතුරු
- කලාවට සිදු වූ සේවය
- ඉදිරිපත් කළ කලා නිර්මාණ

(ලකුණු 10)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

### නර්තනය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | iii | 06. | පතුරු | 11. | පණිභාරත | 16. | සිරසපාද |
| 02. | i | 07. | නමස්කාර | 12. | තිත | 17. | සංදේශ |
| 03. | iii | 08. | අලංකාර පද | 13. | පත්තිනි | 18. | පණ්ඩුකාභය රජු |
| 04. | ii | 09. | පහතරට | 14. | භාව | 19. | ලය |
| 05. | iii | 10. | පා සරඹ | 15. | තක්කඩ | 20. | පැහිදුම් පෙට්ටිය |

(1 x 20 ලකුණු 20)

### II කොටස

01. (අ) (1) පහතරට නර්තන සම්ප්‍රදාය (2) දෙවොල් මඩු ශාන්ති කර්මය (ලකුණු 02)

(ආ) කප්සිටු වීම, මඩුපේ කිරීම, තොටපේ කිරීම (තොටමෙට යාම) ආදී වශයෙන් ලියා ඇත්නම් (ලකුණු 02)

(ඇ) වෙස් ඇඳුම් කට්ටලය, නෙල්මෙ ඇඳුම් කට්ටලය, (ලකුණු 02)

(ඈ) 1 පහතරට බෙරය, දික්බෙරය, දෙවොල් බෙරය, රුහුණු බෙරය, යක් බෙරය, සෝෂක බෙරය (ලකුණු 02)

2 ශාන්ති කර්ම සඳහා, පෙරහැර සඳහා, මඟුල් බෙර වාදනය සඳහා වැඩුම් අත්, දැකුම් අත්, තාලම්, සවුදම්, සුරල් වාදනය සඳහා (ලකුණු 02)

02. (i)

| ∧ | / | ∧ | / |
|---|---|---|---|
| 1 2 | 1 2 3 4 | 1 2 | 1 2 3 4 |
| දොං - | දොං - ජිං - | ජිං - | ග ජි ග ත |

ඉහත ලෙසට ප්‍රස්තාර කර ඇත්නම් (ලකුණු 02)

(ii) අදාළ කවිය නියමිත තිතට ප්‍රස්තාර කර ඇත්නම්, (ලකුණු 04)

(iii) කස්තිරම නියමිත තිත් රූපයට ප්‍රස්තාර කර ඇත්නම්, (ලකුණු 04)

03. (i) චින්නයියා, පොන්නයියා, ශිවනාදන්, වඩිවේලු (ලකුණු 01)

විස්තර කිරීමට (ලකුණු 02)

(ii) අලාරිප්පු, ජතීස්වරම්, ශබ්දම්, වර්ණම්, පදම්, තිල්ලානා, ශ්ලෝකම් (ලකුණු 03)

(iii) කොටස් නම් කිරීමට (ලකුණු 02) විස්තර කිරීමට (ලකුණු 02)

04. (i)
- දළදා වහන්සේට උපහාර පිණිස පැවැත්වීම
- රටට සෞභාග්‍ය උදා කර ගැනීමට
- කලට වැසි ලබා ගැනීම සඳහා (ලකුණු 02)

(ii) නර්තන අංග 04ක් නම් කිරීමට ලකුණු 02

එම නර්තන අංග 04 විස්තර කිරීමට ලකුණු 02 (ලකුණු 04)

(iii) සංස්කෘතික වටිනාකම අගය කිරීමට

(කරුණකට ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න) (ලකුණු 04)

05. එස්. පණිභාරත ගුරුතුමා පිළිබඳව අදාළ ශීර්ෂ යටතේ කරුණු ගොනු කර ඇත්නම් (ලකුණු 10)
- ජීවන තොරතුරු (ලකුණු 03)
- සේවය ඇගයීම (ලකුණු 03)
- කලා නිර්මාණ සඳහන් කර ඇත්නම් (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 8 - 2019

### නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

01. (1) කැමති ගායනය (ලකුණු 05)
    (2) නම් කරන ලද ගායනය (ලකුණු 05)

02. (1) පා සරඹ 79 දක්වා
    සරඹයක් හමාරපදය සමඟ නර්තනය (ලකුණු 05)
    (2) ගොඩ සරඹ 56 දක්වා
    එක් සරඹයක් කස්තිරම සමඟ නර්තනය (ලකුණු 05)

03. (1) වෛරොඩි වන්නමේ කවියක් තාල තබා කීම (ලකුණු 02)
    (2) අලංකාර පදයක් නටා කස්තිරම නර්තනය කිරීම (ලකුණු 08)

04. ගැමි නැටුමක් නර්තනය (පතුරු/සවරං) (ලකුණු 10)

05. නිර්මාණය 'භය' භාවය
    නිරූපණය කරන්න. (සිංහයා, උකුස්සා, නාගයා) (ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 8 - 2019

## නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

01. (1) කැමති ගායනය (ලකුණු 05)
    (2) නම් කරන ලද ගායනය (ලකුණු 05)

02. (1) පා සරඹ 79 දක්වා
    සරඹයක් හමාරපදය සමඟ නර්තනය (ලකුණු 05)
    (2) ගොඩ සරඹ 56 දක්වා
    එක් සරඹයක් කස්තිරම සමඟ නර්තනය (ලකුණු 05)

03. (1) වෛරොඩි වන්නමේ කවියක් තාල තබා කීම (ලකුණු 02)
    (2) අලංකාර පදයක් නටා කස්තිරම නර්තනය කිරීම (ලකුණු 08)

04. ගැමි නැටුමක් නර්තනය (පතුරු/සවරං) (ලකුණු 10)

05. නිර්මාණය ‘භය’ භාවය
    නිරූපණය කරන්න. (සිංහයා, උකුස්සා, නාගයා) (ලකුණු 10)